ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 දෙසැම්බර් 23 දිනැති අංක SA/GFS/01/01/08 – Volume දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු සියලු වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වුවත්, ග්‍රාම නිලධාරී කාර්යාල ඇතුළු ගොඩනැඟිලි 81 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	මෙම ගොඩනැඟිලිවලින් කිහිපයක් වෙනත් ආයතනවලට අයත් වන අතර, සමහර ගොඩනැඟිලි මේ වන විට අළුත්වැඩියා කර භාවිතයට ගෙන ඇති බව.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයට අයත් ගොඩනැඟිලි හඳුනා ගෙන තක්සේරු කර ගිණුම්ගත කළයුතුය.
(ආ)	දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අයත් වර්ග අඩි 17,317 ක විධායක සහ විධායක නොවන රජයේ නිවාස 14 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	කඩිනමින් තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තක්සේරුකර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව.	- එම -
(ඇ)	ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට ලබාදී තිබුණු වත්කම් 38 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	- එම -
(ඈ)	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම සඳහා වන වියදම හා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ වල වර්ෂයේ එකතු වටිනාකම යන අගයන් තුන එකිනෙක සමාන විය යුතු වුවත්, පිළිවෙලින් රු.71,714,715 ක්	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම යටතේ පෙන්නුම් කරන මුදල අදාළ වර්ෂයේ වැය විෂයය අංක 2102,2103 හා 2104 යටතේ වන වියදම් වන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත උපකරණ වැඩි වීම යටතේ අදාළ වර්ෂයේ දී තක්සේරු කරන ලද මුදලත් ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ	විධිමත් පරීක්ෂාවක් සිදු කර නිවැරදි ශේෂය ගිණුම්වල ගැලපිය යුතුය.

	රු.99,811,496 ක් හා රු.79,142,604 ක් ලෙස එකිනෙකට වෙනස් අගයන් පැවතුණි.	වර්ෂයට අදාළ සියලු මූලධන වියදම් ඇතුළත් වන බව.	
(v)	මූල්‍ය ප්‍රකාශන වල ACA 6 ආකෘතියේ දක්වා ඇති ජංගම නොවන වත්කම් වලට අදාළ සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති ආරම්භක ශේෂයන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂයන් අතර රු.10,231,924 ක වෙනසක් පැවතුණි.	ACA 6 ආකෘතියේ දක්වා ඇති ශේෂය භාණ්ඩාගාරය විසින් උඩුගත කරන ලද ගිණුම් වාර්තාවේ සඳහන් මුදල වන අතර අප විසින් සකස් කරන ලද සිගාස් වැඩසටහනට අදාළ ශේෂය වෙනසක් නොමැති බව.	මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව ශේෂයන් අතර වෙනස්කම් සසඳා නිවැරදි අගය ගිණුම් තුළ දැක්විය යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ සඳහන් 1.6.1 (i), 1.6.1 (ii), 1.6.1 (iii), 3.2 (ii), 4.9 (ඇ), 4.3 හා 4.9 (අ) ඡේදවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	දිස්ත්‍රික් කළමනාකරණ කමිටුව විසින් අදාළ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිතාවය මාසිකව සමාලෝචනය කරන අතර ඉදිරියේදී එහි පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් 11 කට පිළිතුරු ලබා දී නොතිබුණි.	වෙනත් අංශ මගින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් තොරතුරු ලබා ගෙන පිළිතුරු නැවත සකස්කර ඉදිරිපත් කල යුතු බවත් පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ පූර්ව කටයුතු සඳහා නිලධාරින් යොදවා තිබීම නිසා මෙම අපහසුතාව තවත් වැඩිවූ බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීති,රීති හා රෙගුලාසි වලට යොමුව		අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 (1) (ඉ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින රජයේ නිවාස 37 ක් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාගෙන අලුත්වැඩියාකර වත්කම් සුරක්ෂිතව තබා ගැනීමට හා සංරක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ දී ලැබුණු ප්‍රතිපාදන වලින් රජයේ නිවාස අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින බවත්, ඉල්ලීම් ලබා ගැනීමෙන් පසු අලුත්වැඩියාවන් සිදු කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වත්කම්වල සුරක්ෂිතතාවය සඳහා අළුත්වැඩියාවන් නිසිකලට සිදු කිරීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දීප ව්‍යාප්ත සේවාවලට අයත් නිලධාරීන් හා දීප ව්‍යාප්ත සේවාවලට අයත් නොවන නිලධාරීන් සම්බන්ධයෙන් වසර 05 ක් අවසානයේ අනෙකුත් නිලධාරීන් සඳහා අවස්ථාව සැලසෙන පරිදි ස්ථාන මාරු සාමාන්‍ය පොදු ප්‍රතිපත්තිය අනුව කටයුතු කළයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක නිලධාරීන් 338 දෙනෙකු සඳහා උක්ත ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි.	අභ්‍යන්තර ස්ථානමාරුවීම්ද සිදුකර තිබේ. වාර්ෂික ස්ථානමාරුවීම් සඳහාද ඉල්ලුම් කර ඇති අතර, ඉදිරියේදි අනුප්‍රාප්තිකයන් සහිතව ස්ථානමාරුවීම් සිදුකිරීමට නියමිත බව.	චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ස්ථාන මාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

3.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ.371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්ය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම, කරුවලගස්වැව, මහකුඹුක්කඩවල හා වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව අවස්ථා 24 ක දී නිකුත් කර තිබූණු රු.1,318,162 ක අතුරු අග්‍රිමයන් දින 05 ත් – 93 ත් අතර කාල ප්‍රමාදයකින් පසු පියවා තිබුණි.	අත්තිකාරම් මුදල් පියවීම නිලධාරින්ගෙන් සිදු වූ අඩුපාඩුවක් වන අතර ඉදිරියේදි මෙවැනි ප්‍රමාද වීම් වලින් තොරව නිවැරදිව කටයුතු කරන බව .	නීතිමය විධිවිධානයන්ට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආපදාකළමනාකරණ අමාත්‍යාංශයේ සුරක්ෂිත මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් රු.1,367,059 ක් වැයකර ඉදිකර තිබුණු වැසිකිලි පද්ධතිය නිසි ප්‍රමිතියට ඉදි නොකිරීම හේතුවෙන් පාවිච්චි කිරීමෙන් තොරව නිශ්කාර්යව පවතී.	මනතීව් සායන මධ්‍යස්ථානයේ ඉදිකළ වැසිකිලි පද්ධතිය ආපදා අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉදිකරන ලද්දක් බවත් මාසික සායන පැවැත්වෙන අවස්ථාවලදී එහි ඉදිකර ඇති වැසිකිලි පද්ධතිය ගර්භණී මව්වරුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කරන බව.	නිසි ප්‍රමිතියට ගැලපෙන පරිදි අදාළ කටයුතු සිදු කර භාවිතය සඳහා සූදානම් කළ යුතුය.

(ආ)	මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.31,127,703 ක් වැයකර ඉටුකර තිබුණු සංවර්ධන ව්‍යාපෘතීන් 112 න් රු.2,168,322ක් වූ ව්‍යාපෘති 25 ක්ම ප්ලාස්ටික් පුටු බෙදා දීම් වන අතර ජාතික නිෂ්පාදනයට සෘජු දායකත්වය ලබා දෙන ව්‍යාපෘති හඳුනා ගැනීම කෙරෙහි පූර්ණ අවධානය යොමු වී නොතිබුණි.	2024 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ MF/02/2023 අනුව එහි 1.5 හා 1.10 ඡේද ක්‍රියාත්මක කරන ලද බවත් 2025 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ MF/02/2025 මඟින් දේශීය නිෂ්පාදන ආර්ථිකයක් ළඟාකර ගැනිම පිණිස යෝජිත ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ කටයුතු කිරීමට දක්වා ඇති බැවින් ඉදිරියේදී එසේ විශාල වශයෙන් පරිසරයට ප්ලාස්ටික් එකතු වීමේ අවධානමෙන් මිදී කටයුතු කිරීමේ හැකියාව ලැබෙනු ඇති බව.	විධිමත් පරීක්ෂාවක් කර ව්‍යාපෘති හඳුනා ගැනීමේ ක්‍රමවේදයට අනුකූල නොවන ලෙස ව්‍යාපෘති හඳුනාගෙන තිබේ නම් අදාළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, ඉදිරියේදී අදාල චක්‍රලේඛ හා විධිවිධානවලට අනුකූලව ජාතික නිෂ්පාදනයට දායක වන ව්‍යාපෘති හඳුනා ගැනීමටත්, කටයුතු කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී විදුලි පද්ධතිය වෙනුවෙන් රුපියල් මිලියන 1.898 ක පමණ මුදලක් වැය කර තිබුණු නමුත්, එය නිසි පරිදි සකස් නොකිරීම හේතුවෙන් නිරන්තර විදුලි බිඳ වැටීම් සිදුව තිබුණි.	වැසි සමයේ වහලයේ පවතින ජල කාන්දුවක් හේතුවෙන් විදුලිය විසන්ධි වීම සිදුවන බවත් පිළිසකර කර ගැනීමට ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති අතර 2025 වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව .	විදුලිය විසන්ධිවීමට හේතුව සොයා බලා නොපමාව පිළියම් යෙදීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි සනීපාරක්ෂක පද්ධතිය වෙනුවෙන් අදියර 1 සඳහා රු.645,780 ක් හා අදියර 2 සඳහා රු.679,671 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 1.325 ක් වියදම් කර තිබුණ ද, සනීපාරක්ෂක පද්ධතිය අපිරිසිදු තත්ත්වයෙන් පවතින අතර පද්ධතියෙහි ඇතැම් උපකරණ අකර්මන්‍ය වී තිබුණි. තවද, කාර්යාලයේ නිලධාරීන් හට රාජකාරී ඉටු කිරීමට බාධාවන අයුරින් දුර්ගන්ධය වහනය වෙමින් පැවතුණි.	මෙම ප්‍රදේශයේ ඇති ජලයෙහි කිවුල් තත්ත්වය හේතුවෙන් කැල්සියම් බැදීම නිසා වැසිකිලි පද්ධතිය නිරන්තර අවහිරතාවයට පත්වේ.ජල නළ පද්ධතියේ අවහිරතා ඉවත් කර එම ජල නළ පද්ධතිය අලුත් වැඩියා කිරීම සඳහා 2025 වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව.	මෙම කාර්ය සඳහා ප්‍රමුඛතාවය ලබා දී අදාළ අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගත යුතුය.

(ඇ)	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.2,510,170 ක් වැයකර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මාර්ටින් බවුම මාර්ගය සංවර්ධනය කර තිබුණ ද, ප්‍රතිලාභී පවුල් 02 ක් පමණක් එම මාර්ගය භාවිතා කර තිබුණි.	මෙම මාර්ගය සංවර්ධනය කිරීමට ප්‍රදේශයේ ග්‍රාමීය කමිටුව විසින් තෝරා ගන්නා ලද අතර කෙටි මාර්ගයක් ලෙස ප්‍රදේශවාසීන් භාවිතා කරන බැවින් සංවර්ධන කිරීමට කටයුතු කරන ලද බවත් ඉදිරියේදී මාර්ග තෝරාගැනීමේදී සෘජු ප්‍රතිලාභීන් වැඩිපිරිසක් සිටින මාර්ග වලට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරන බව.	ඉදිරියේදී ව්‍යාපෘති තෝරා ගැනීමේදී අදාළ නිර්නායක මත පදනම්ව ව්‍යාපෘති තෝරාගත යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ රු.8,584,815 ක් වැයකල ජල ව්‍යාපෘති 09 ක් හා 2022 ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ රු.3,357,861 ක් වැයකර ඉදිකර තිබුණු රජයේ ගොඩනැඟිලි 06 ක් නිම කිරීමට මූල්‍ය පහසුකම් නොලැබීම මත අතහැර දමා තිබුණි.	2019 වර්ෂයේ දී ගම්පෙරළිය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ජල ව්‍යාපෘති 09 සම්බන්ධයෙන් මේ වනවිට පුත්තලම් දිස්ත්‍රික් ප්‍රජාජල සැපයුම් ඒකකය විසින් සැලසුම් සකස්කර ඉදිරි කටයුතු සිදුකරන බවද, නිෂ්කාර්යය ගොඩනැගිලි 06 සඳහා විකල්ප ක්‍රියාමාර්ග මඟින් හෝ ප්‍රතිපාදන සපයාගෙන ඉදිරි කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති බව .	අදාළ ව්‍යාපෘති නිම කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ගණන්දීමේ නිලධාරී දින 43 ක් ප්‍රමාදවී අනුමත කර තිබුණි.	වාර්ෂික ප්‍රසම්පාදන කටයුතු සකස් කර ගණන් දිමේ නිලධාරි අනුමත කර ඇත. මෙම වසරේ සිට නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු සිදු කරගෙන යන බව.	නියමිත විධිවිධාන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරවා ගැනීමට පියවර ගත යුතුය.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2, 4.2.3 හා 2024 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.5 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම දක්වා එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් කාලානුක්‍රමිකව විස්තර කෙරෙන පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් (PTS) පිළියෙල කර නිරන්තර යාවත්කාලීන කිරීම ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම වුවද, එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි.	ජාතික ලංසු කැඳවීම් වලට අදාලව ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කළ අතර, මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කල ප්‍රසම්පාදන ක්‍රියාවලින් සඳහා ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කර නොමැති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	රු.25,732,960 ක් වැයකර ඩෙස්ක්ටොප් හා ලැප්ටොප් පරිගණක 99 ක් අවස්ථා 03 ක දී මිලදී ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසුම් අනුව පරිගණක 21 ක් සඳහා පමණක් ඇස්තමේන්තු සකසා තිබුණි. විධිමත් පරිදි අවශ්‍යතා හඳුනාගෙන එකවර ප්‍රසම්පාදනයන් සිදු නොකිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් පරිදි පළමු පරිගණක මිලදී ගැනීම සිදු කරන ලදි. නමුත් වර්ෂය මැදදී ප්‍රතිපාදන අවස්ථා කිහිපයකදී ලැබීම මත සහ අවශ්‍යතා අවස්ථා කිහිපයකදී ලබා දීම මත පරිගණක එකවර මිලදී ගැනීමට නොහැකි වූ බව.	අවශ්‍යතාවය පූර්ව නිශ්චය කර ඒ මත පදනම්ව ප්‍රතිපාදන ලබාගෙන විධිමත් සැලැස්මක් යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය.
(ඈ)	2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2020 ජනවාරි 31 දිනට පෙර රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන (e - GP) පද්ධතිය තුල ප්‍රසම්පාදන අස්තිත්වයක් ලෙස ලියාපදිංචි වී චක්‍රලේඛ උපදෙස් පරිදි විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය වන විට වසර 05 ක් ගතවී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. .	2025 වර්ෂයේ සිට නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන ඒකකයක් (PMD) පිහිටුවා ඉලෙක්ට්‍රොනික් ප්‍රසම්පාදන පද්ධතිය (e-GP) තුළ ප්‍රසම්පාදන අස්ථිත්වය ලියාපදිංචි කර ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවූ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, රජයේ විද්‍යුත් ප්‍රසම්පාදනයට අනුකූලව කටයුතු කිරීම කඩිනමින් සිදු කිරීමත් කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා බාහිර පරිශ්‍රයේ 2016 වර්ෂයේ රුපියල් මිලියන 3.25 ක් වැයකර ස්ථාපිත කර තිබුණු කැමරා 54 කින් යුත් CCTV පද්ධතිය සුදුසු තාක්ෂණික ක්‍රමවේදයන් හා කාලීනව සිදුකල යුතු යාවත්කාලීන කිරීම් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් වසර 05 ක කාලයක සිට අක්‍රීයව උපකරණ විනාශ වෙමින් පැවතුණි.	CCTV පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා වරින් වර මිල ගණන් ලබා ගත් නමුත්, ඒ සඳහා විශාල මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර, එකී ආයතන මඟින් වගකීම් කාලයක් ලබා දීමටද නොහැකි බව දන්වා ඇති බැවින් එය සිදු කර නොමැත කෙසේ නමුත් ඉදිරියේදී මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීමට කටයුතු කරන බව.	විධිමත් අධ්‍යයනයක් සිදු කර ආර්ථිකබව, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය කෙරෙහි අවධානය යොමු කර CCTV පද්ධතිය සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතුය.

4.6 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශයේ ඇමුණුම් (II) පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 03ක වසර 01 ත් වසර 19 ත් අතර කාල සීමාව තුළ හානි වටිනාකම රු.1,411,204 ක අනතුරු සිදුව තිබුණු නමුත් එකී හානි පාඩු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා, සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2006 ඔක්තෝබර් 14 දින සිදුවූ අනතුරට අදාලව රු.305,804ක මුදල පොතෙන් කපා හැරීමට නිර්දේශ කර ඇති බවත්. 2007 අගෝස්තු 27 දින සිදුවූ රථ අනතුරට අදාල තොරතුර සොයා ගැනීමට අපහසු බවත්. 2013 ජූලි 05 දින සිදුවූ අනතුරට අදාල පරීක්ෂණ කටයුතු නිම කර ඇති අතර රියදුරුගෙන් රු.5,521.51 ක වාරික වශයෙන් අලාභය අයකරමින් පවතින බවත්. 2021 පෙබරවාරි 11 දින සිදු වූ රථ අනතුරට හා 252-9871 රථ අනතුරට අදාළ පරීක්ෂණ කටයුතු කරමින් පවතින බව.	හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපමාව කටයුතු කළ යුතු අතර, පාඩු හා හානි සම්බන්ධ පරීක්ෂණ ප්‍රමාද කිරීමට අදාළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, පවතින පාඩු හා හානි සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනමින් නිම කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හානි පාඩු ලේඛනය අනුව ඉන්ධන බිල්පත් 25 ක් අස්ථානගත වී තිබුණු අතර, ඊට අදාලව එහි වටිනාකම කොපමණදැයි නිගමනය කල නොහැකි බැවින්, ඒ සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.	2024 දෙසැම්බර් 19 දින පොලිස් පැමිණිල්ලක් යෙදීමට ද විවිධසේවා සමූපකාර සමිතිය පුත්තලම හා වනාතවිල්ලුව, දැනුවත් කිරීමටද කටයුතු කර ඇත. මේ සම්බන්ධව මේ වන විට මු.රෙ.104(4) යටතේ පරීක්ෂණයක් සිදු කරන බව.	මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පරීක්ෂණ කටයුතු කඩිනමින් නිම කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

4.7 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 02 රැස්වීම් ශාලාව ඉදිකිරීම සඳහා රු.1,211,093 කට වැඩිහිටි සමිතියක් සමඟ එළඹි ගිවිසුම අනුව ඇස්තමේන්තුව හා ඊට අදාළ ඉදිකිරීම් භෞතික පරික්ෂාවේදී රු.32,464 ක් වැඩිපුර ගෙවා ඇති බවත්, අදාළ පිරිවිතර අනුව ඉටු නොකළ කාර්යයක් සඳහා රු.15,662 ක් ගෙවීම් කර තිබුණ බවත් නිරීක්ෂණය විය.	මිලිමීටර 150x75 ප්‍රමාණයේ Purline සඳහාගෙවන ලද මුදල ප්‍රමාණනය කර, ඒ සඳහා වැය වන මුදල ව්‍යාපෘතියේ රැඳවුම් ගෙවීම සිදුකිරීමේ දී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බවත් අයිතම අංක 17 අනුව සිදුකළ යුතු වහලයේ මුදුන (කුවේර) ඇස්බැස්ටස් ෂීට් වලින් වසා නට් සහ බෝල්ට් දමා සවිකිරීම අදාල සමිතිය මඟින් ඉටුකරවා ගැනීමට කටයුතු කරන බව.	ඇස්තමේන්තුකල කාර්යයන් ඉටුකල බවට තහවුරු කරගෙන ගෙවීම් කළයුතු අතර වැඩිපුර කළ ගෙවීම් හා අවිධිමත් ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

4.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව 2024 ගිණුම් වර්ෂයට අදාළව 2025 පෙබරවාරි 07 දින සිට අප්‍රේල් 25 දින දක්වා විගණන විමසුම් 11 ක් නිකුත් කර තිබුණු නමුත්, එම විමසුම් සඳහා දින 02ත් 64 ත් අතර කාලයකින් පිළිතුරු ලබා දීම ප්‍රමාද වී තිබුණි.	වෙනත් අංශ මගින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් තොරතුරු ලබා ගෙන පිළිතුරු නැවත සකස්කර ඉදිරිපත් කල යුතු අතර එමෙන්ම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ පූර්ව කටයුතු සඳහා නිලධාරින් යොදවා තිබීම නිසා මෙම අපහසුතාව තවත් වැඩිවූ බව.	විගණන පනතේ විධිවිධාන හා මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් විගණන විමසුම්වලට කාලීනව පිළිතුරු ලබා දීමට කටයුතු නොකිරීමට අදාළ නිලධාරීන්ට පියවර ගත යුතු අතර, විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම කඩිනම් කිරීම කළ යුතුය.

4.9 කළමනාකරණ දූර්වලතා

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14ක I හා II අදියර ලෙස පිහිටුවා තිබුණු සමිති 173 ක් අතුරින් 149 ක රු.98,115,769 ක අරමුදල් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව	අක්‍රිය ග්‍රාම ශක්ති සමිති සතු රජයේ අරමුදල් හා ඊට අදාළ පොලිය සම්බන්ධව මේ වන විට කටයුතු කර ඇති බව.	මෙම අරමුදල් විධිමත් අනුමැතිය යටතේ සක්‍රීය සමිති සඳහා යොදවා ගැනීම හෝ දිස්ත්‍රික් ලේකම් පොදු තැන්පත් ගිණුමට බැර කිරීමට හෝ කටයුතු කළ යුතුය.

	පැවති අතර, එකී රජයේ අරමුදල් සක්‍රීය සමිති සඳහා යොදවා ගැනීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් අරමුදලේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ආ)	වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගාල් කර ඇති කැබ්රථයක් සහ බවුසර් රථයක් වසර කිහිපයක් මුළුල්ලේ නිශ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි.	රථ ධාවනයට නුසුදුසු මට්ටමේ පවතින බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ භාරයට ගැනීමටත් අළුත්වැඩියා කළ නොහැකි වාහන සම්බන්ධ තොරතුරු යටතේත් 2021 වර්ෂයේ දන්වා ඇති බවත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්.	නිශ්කාර්යව දිරාපත් වෙමින් පවතින වාහන දෙක සම්බන්ධයෙන් කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ඇ)	රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ 2020/21 මහ කන්නයේ හා 2021 යල කන්නයේ දී වී මිලදී ගැනීමට අදාලව 2025 මාර්තු 21 දිනට දිස්ත්‍රික්කයේ සහල් මෝල් හිමියන් 20 කගෙන් වසර 4 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.106,171,069 ක මුදල හා ඊට ආවස්ථික මූල්‍ය පොලියක් ගණනය කර රජයට අයවිය යුතු මුදල අයකර ගැනීමට හෝ සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කඩිනමින් ක්‍රියා කළයුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව මේ සඳහා සහන කාලයක් ලබා දී ඇති බව.	වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කර අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව රජයට අයවිය යුතු මුදල් නියමිත දිනයන්ට අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	මාදම්පේ කොන්ගස්යාය වැවෙහි (පනිරෙන්ඩාව වැව) කොන්ක්‍රීට් වානක් ඉදි කිරීම හා බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019 ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් යටතේ ගොවි සංවිධානයකට පවරා දී තිබුණු අතර එහි වැව් බැම්ම වැඩිදියුනු කිරීම වෙනුවෙන් රු.330,610 ක් වැය දරා තිබුණද, වැව් බැම්ම මත මැරී තිබුණු සියඹලා ගසේ මුල් ඉවත් නොකර ප්‍රතිසංස්කරණය කිරීමෙන් ගසේ මුල් දිරා යැමේදී වැව් බැම්මට හානියක් විය හැකිව තිබුණි. තවද, වැවෙන් පෝෂණය වන කුඹුරු ප්‍රමාණය අක්කර 03 යි රූඩ් 02 ක් වීම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව දැනට වගා කරන ගොවීන් 02 ක් පමණක් බවත් නිරීක්ෂණය විය.	ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරන ලද දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ තාක්ෂණ නිලධාරින් විසින් වැව් බැම්මට හානිවිය හැකි බැවින් මැරී තිබූ සියඹලා ගසෙහි අතු කොටස් හැර කඳෙහි අවසන් කොටස සහිත මූල පද්ධතිය ඉවත් නොකරන ලෙස වාචික උපදෙස් ලබා දුන් බව ගොවි සංවිධානය විසින් ලිඛිතව දන්වා ඇති බව.	ප්‍රතිලාභ උපරිම කිරීමේ වැඩපිළිවෙලක් යෙදීමටත්, තාක්ෂණික උපදෙස් මත වැව් බැම්මේ ආරක්ෂාව තහවුරු කිරීමටත් පියවර ගත යුතුය.

(ඉ)	2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගතයුතු වුවත්, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කර මියගිය නිලධාරියෙකුගේ රු.243,840 ක ණය ශේෂය වසර 1 ½ ක් ගතවීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිලධාරියාගේ මරණ පාරිතෝෂිකය මඟින් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් නිලධාරී වෙත තොරතුරු ලබා දී ඇති බව.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළයුතුය.
(ඊ)	2007 හා 2009 වර්ෂයේ සේවය අතහැර ගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු.189,300 ක මුදල වසර 11 හා 18 කට අධික කාලයක් ගතවී ඇතත්, 2024 මැයි 29 දිනැති අංක PFD/RED/REG/CIR/2023/04 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	එක් නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීමක් සිදුවුවහොත් මුළු ණය මුදලම අයකර ගැනීමට අවධානය යොමුව ඇති අතර, අනෙක් නිලධාරියා දිස්ත්‍රික් ලේකම් විසින් යැවූ ලිපි භාර නොගන්නා බැවින්, නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අපහසුව පවතින බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර කාලීනව ණය අය කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ණය කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

5. යහපාලනය

විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.3 උප වගන්තිය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් එනම් වර්ෂයකට 4ක් වන පරිදි පැවැත්විය යුතු වුවත් ශීර්ෂ අංක 273 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16න් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක කමිටු රුස්වීම් 03 ක් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක කමිටු රැස්වීම් 02 ක් හා එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රැස්වීම් 01 බැගින් ද පවත්වා තිබුණි.	2024 වර්ෂයේ ජනාධිපතිවරණ ඡන්ද විමසීම හා පාර්ලිමේන්තු ඡන්ද විමසීම පැවතීම හේතුවෙන් නියමිත ප්‍රමාණයට විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට නොහැකිව තිබූ බවත් 2025 වර්ෂයේ නියමිත පරිදි සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමට කටයුතු කරන බව.	අදාළ චක්‍රලේඛ විධිවිධාන පරිදි නියමිත රැස්වීම් වාර සංඛ්‍යාව පැවැත්මට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාලව තනතුරු 04 ක නිලධාරීන් 18 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු 03ක නිලධාරීන් 11 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 07 ක නිලධාරීන් 230 ක් ද පුරප්පාඩුව පැවතුන අතර, ද්විතියික මට්ටමේ සංවර්ධන නිලධාරීන් අනුමත ප්‍රමාණය ඉක්මවා 75 ක් සිටින බව නිරීක්ෂණය විය.	කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් මාසිකව හා කාර්තුමය වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ලබන බවත්, 2025 වර්ෂයේදී සිදු කළ බඳවා ගැනීම් වලදී ප්‍රාදේශීය ලේකම් තනතුරු 03 ක්, සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරක්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක්, පරිපාලන නිලධාරී තනතුරු 02 ක් සහ කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 30 ක් සම්පූර්ණ වී ඇති බව.	කාර්ය මණ්ඩල අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කර, පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමටත්, අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින ස්ථානවලට අනුයුක්ත කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.